# සිංහල සාහිත්‍ය රසාස්වාදය

## 10-11 ශ්‍රේණි

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ගුරු මාර්ගෝපදේශය

## 10 -11 ශ්‍රේණි

(2015 සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : infor@nie.lk

සිංහල සාහිත්‍ය රසාස්වාදය

10 - 11 ශ්‍රේණි

ගුරු මාර්ගෝපදේශය

පළමුවන මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ...................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : infor@nie.lk

මුද්‍රණය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

***ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව*** මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය

විෂය විශේෂඥ උපදෙස් : මහාචාර්ය රත්තසිරි අරංගල
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ.

මහාචාර්ය ජයන්ත අමරසිංහ
රුහුණු විශ්වවිද්‍යාලය
මාතර

සම්බන්ධීකරණය : ඩී. ඩබ්ලිව්. දිසානායක මිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය

තිලිනි රත්නායක මිය
කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය

විෂය කමිටුව : ඩී. ඩබ්ලිව්. දිසානායක මිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මයා
කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි :
කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ජී. මුණසිංහ මයා
කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

තිලිනි රත්නායක මිය
: කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

:

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මයා
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පී. ඒ. ඩී. රුවනි සිසිජා මිය
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

| | |
|---|---|
| බාහිර ලේඛක මණ්ඩලය : | එස්. ඕ. ප්‍රනාන්දු මයා<br>අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | එච්. එල්. එස්. අබේවික්‍රම මිය<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ<br>ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | එච්. පී. සුසිල් සිරිසේන මයා<br>කථිකාචාර්ය<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය<br>මීරිගම |
| | ස්වර්ණා වීරසිංහ මිය<br>ගුරු උපදේශිකා<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කැලණිය |
| | වයි. පී. එන්. පී. විමලසිරි මිය<br>ගුරු උපදේශිකා<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>ශ්‍රී ජයවර්ධනපුර |
| | ගයා වැයිහේන මයා<br>ගුරු උපදේශක<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය<br>පාදුක්ක |
| | සුනිල් බියන්විල මයා<br>ගුරු සේවය I<br>ගිරි/වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල |
| | අරුණ ඉන්දික වේරගල මයා<br>ගුරු සේවය I<br>කො/ආනන්ද බාලිකා විද්‍යාලය<br>කොළඹ 10 |
| විවිධ සහාය : | ඒ. රාජපක්ෂ මිය<br>මොනිකා විජේකෝන් මිය<br>නිලුපා අබේරත්න මිය<br>උපාලි ජයලත් මයා |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

10 සහ 11 ශ්‍රේණිවලට අදාළ සාහිත්‍ය රසාස්වාදය විෂය සඳහා මෙම ගුරු ගුරුමාර්ගෝපදේශය සකස් කර ඇත. සාහිත්‍ය රසාස්වාදය විෂය නිර්දේශයට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම ඇගයීම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය මගපෙන්වීම් මෙහි ඉදිරිපත් කර තිබේ. සාහිත්‍ය රසාස්වාදය විෂය හැදෑරීමේ දී නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය අවධිය පිළිබඳ අවබෝධයක් හා සාහිත්‍ය නිර්මාණය පිළිබඳ අවබෝධයක් ද සහිත ව නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ රසවිඳීමේ හැකියාව වර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කර ඇත.

සාහිත්‍ය රසාස්වාදය විෂය ඉගැන්වීමේ දී නියමිත සාහිත්‍ය කෘතිය මෙන් ම එම සාහිත්‍ය විෂය සම්බන්ධ ව ප්‍රමාණිකයන් විසින් සම්පාදනය කරන ලද, පරිශීලනය කළ යුතු ග්‍රන්ථ කිහිපයක් ගුණාත්මක යෙදවුම් යටතේ ගුරුභවතාගේ දැනුම සංවර්ධනය සඳහා ඉදිරිපත් කර ඇත. එම ග්‍රන්ථ පරිශීලනයෙන් ලබාගත් දැනුම ඉගැන්වීම් කාර්යයේ දී යොදා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. විෂය නිර්දේශයේ ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල අත්පත් කර ගත හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය. ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් යෝජනා කර නැතත් නිර්මාණශීලි ව ඉගැන්වීමේ ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ පූර්ණ නිදහස ඔබට ඇත.

ලේඛක මණ්ඩලය

# පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂය විශේෂඥ උපදෙස් | v |
| විෂයමාලා කමිටුව | vi |
| බාහිර ලේඛක මණ්ඩලය | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x - xxiv |
| හැඳින්වීම | ix |
| ජාතික පොදු අරමුණු | x |
| පොදු නිපුණතා | xii |
| විෂය අරමුණු | xii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-18 |

# හැඳින්වීම

සිංහල සාහිත්‍යය හා රසාස්වාදය 10 සහ 11 ශ්‍රේණි සඳහා පමණක් ක්‍රියාත්මක විෂයකි. අ.පො.ස.සා.පෙළ විෂය නිර්දේශයේ කාණ්ඩ විෂය යටතේ දෙවන කාණ්ඩයට අයත් වේ. මෙවැනි විෂයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමේ මූලික අරමුණ වූයේ සිංහල භාෂාව හා සාහිත්‍යය කෙරෙහි ඇල්මක් දක්වන ශිෂ්‍යයන්ට වඩාත් ගැඹුරින් එකී විෂය හැදෑරීමේ අවස්ථාව උදාකර දීමයි. සාහිත්‍යය කෙරෙන් සිසු පරපුර දුරස්වෙමින් පවතී යැයි ද, භාෂාව පිරිහෙමින් ඇතැයි ද චෝදනා නැගෙන මෙවන් සමයක පාසල් ශිෂ්‍යයා හැකිතාක් සාහිත්‍යය කෙරෙහි සමීප කරමින් සාහිත්‍යය පිළිබඳ ව, සිසු ළැදියාව වර්ධනය කිරීම සඳහා යම් පිටුබලයක් සැපයීම මෙම විෂයේ අරමුණු අතර වෙයි.

විෂය අන්තර්ගතය තෝරා ගැනීමේ දී පුරාතන ගද්‍ය පද්‍ය, නවකතා, කවි, ගීත ජන සාහිත්‍යය හා නාට්‍යය ආදි පුළුල් ව පැතුරුණු සාහිත්‍යාංග කෙරෙහි අවධානය යොමු කර ඇති මෙමගින් සිසුන්ට සෑම සාහිත්‍යාංගයක් කෙරෙහි ම අවබෝධයක් ලබා ගැනීමට මෙන් ම විවිධත්වයකින් යුතු ව සාහිත්‍ය නිර්මාණ ඇසුරු කිරීමට අවස්ථාව සලසා දී තිබේ. නිර්දේශිත සාහිත්‍ය කෘති පරිශීලනයෙන් එක් එක් සාහිත්‍ය කෘතියෙහි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් සාහිත්‍ය නිර්මාණ අතර විශේෂතා පිළිබඳ ව ද, අවබෝධයක් ලබා ගැනීමට අවකාශ ලැබේ. සාහිත්‍ය නිර්මාණ තෝරා ගැනීමේ දී විවිධ සාහිත්‍ය යුග නියෝජනය වන හෙයින් සාහිත්‍යයේ ක්‍රම විකාශයත් එක් එක් යුගවල විවිධත්වය හා අනන්‍යතාව පිළිබඳවත් වැටහීමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට අවකාශය ලැබෙනු ඇත.

මෙම සාහිත්‍ය නිර්මාණ තුළ ගැබ් වූ අපරිමිත මානව අත්දැකීම් හා මානව සංවේදනා ශිෂ්‍යයා ස්වකීය මනසින් ස්පර්ශ කරනු ඇත. අත්දැකීම් සපිරි පරිණත පුද්ගලයකු ලෙස අනාගත ලෝකයට මුහුණ දීම සඳහාත්, භාෂා මාමකත්වයෙන් හා සාහිත්‍ය ප්‍රේමීත්වයෙන් යුතු ව කටයුතු කිරීම සඳහාත් අවශ්‍ය හුරුව හා පෙලඹවීම ශිෂ්‍යයා තුළ ඇති කළ හැකි නම් එය මෙම විෂයයේ අරමුණු ජය ගැනීමකි. ශිෂ්‍යයා තුළ වූ නිර්මාණශීලිත්වය අවදි කර ගනිමින් පෘථුල වූ වාක්කෝෂයකින් හා බහුල අත්දැකීම් සහිත වූ ප්‍රායෝගික භාෂා කාර්යයෙහි නිරත වීමටත් සාහිත්‍ය නිර්මාණකරණයේ නියැලීමටත් යම් සානුබලයක් සිංහල සාහිත්‍යය හා රසාස්වාදය විෂයයෙන් ලැබේ යැයි අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති කණ්ඩායම

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම.

VI. පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම. |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය. |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම. |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම. |

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්,අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්. |

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අරමුණු

1. සිංහල සාහිත්‍යය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.

2. සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි, සාහිත්‍ය ශිල්පීය මූලධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.

3. විචාරාත්මක හා වින්දනාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කර ගැනීම.

4. සාහිත්‍යය පරිශීලනයෙන් නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

5. සාහිත්‍යය පිළිබඳ පුළුල් හා ගැඹුරු දැනුමක් ගොඩනගා ගැනීම සඳහා පදනමක් සකසා ගැනීම.

6. සිංහල සාහිත්‍ය නිර්මාණ හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | • නිර්දිෂ්ට නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම<br>- නිර්දිෂ්ට කෘතිවල නිර්මාණකරුවන්<br>- ලියවුණු කාලය<br>- එම කතුවරුන්ගේ වෙනත් නිර්මාණ<br>- සමකාලීන වෙනත් කතුවරු<br>- ඔවුන්ගේ නිර්මාණ | • නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිය අයත් සාහිත්‍ය අවධිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• කතුවරයා හා එම කෘතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• එම අවධියේ ලියවුණු වෙනත් නිර්මාණ හා සාහිත්‍යකරුවන් නම් කරයි. | ඒ ඒ කෘති වලට වෙන්කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |
| | 1.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පැහැදිලි කරයි. | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ලිඛිත් බසින් ඉදිරිපත් කිරීම.<br>(කුස ජාතකය හා සුභාෂිතය) | • සාහිත්‍ය නිර්මාණ කියවා අදහස ප්‍රකාශ කරයි.<br>• උද්ධෘත පාඨ ලිඛිත් බසින් ලියා දක්වයි.<br>• දුරවබෝධ පදවල අර්ථ දක්වයි. | |
| | 1.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | • නිර්දිෂ්ට නිර්මාණවල අවස්ථා සම්බන්ධය දැක්වීම.<br>(කුස ජාතකය, වෙසක් පහන, තුංමං හන්දිය) | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ නිවැරදි ව හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණකරුවන් නම් කරයි.<br>• අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි. | |

## සාහිත්‍ය රසාස්වාදය විෂය නිර්දේශය - 10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි. | 2.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • කුස ජාතකය | • ජාතක කතාවේ කතා සාරය ඉදිරිපත් කරයි<br>• ජාතක කතාවේ චරිත ලක්‍ෂණ විග්‍රහ කර දක්වයි<br>• ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි<br>• කුස ජාතකයේ භාෂා ලක්‍ෂණ ඉදිරිපත් කරයි<br>• කුස ජාතකය රස විඳිමින් විචාරය කරයි | 11 |
| | 2.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • සුභාෂිතය තෝරා ගත් කවි | • නිර්දිෂ්ට පද්‍ය කියවා උපදෙස් පැහැදිලි කරයි<br>• උපදෙස් දැක්වීමේ දී උපමා භාවිත කර ඇති අයුරු පැහැදිලි කරයි<br>• පද්‍ය රසවිඳිමින් විචාරයේ යෙදෙයි | 11 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0<br>නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රස විඳිමින් විචාරය කරයි. | 3.1 කෙටිකතා ලක්‍ෂණ විමර්ශනය කරයි. | • කෙටිකතා ලක්‍ෂණ හඳුනා ගැනීම | • කෙටි කතාව සාහිත්‍යාංගයක් ලෙස හඳුනාගෙන අදහස් ඉදිරිපත් කරයි<br>• කෙටිකතා ලක්‍ෂණ ඉදිරිපත් කරයි<br>• කෙටිකතා පිළිබඳව විවිධ වූ නිරිවචන ඉදිරිපත් කරයි | 03 |
| | 3.2 කෙටිකතා පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • වෙසක් පහන කෙටි කතාව ජී.බී. සේනානායක | • කෙටි කතාවේ කතා සාරය ඉදිරිපත් කරයි<br>• කෙටි කතාවේ චරිත හඳුනාගෙන ඉදිරිපත් කරයි<br>• කෙටි කතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | 06 |
| | 3.3 නවකතා ලක්‍ෂණ විමර්ශනය කරයි. | • නවකතා ලක්‍ෂණ හඳුනා ගැනීම | • නවකතාව සාහිත්‍යාංගයක් ලෙස හඳුනාගෙන විස්තර කරයි<br>• නවකතාවේ චරිත හඳුනාගෙන ඉදිරිපත් කරයි<br>• නවකතාවේ තිබියයුතු මූලික ලක්‍ෂණ හඳුනාගෙන විස්තර කරයි<br>• නවකතාව පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් කරයි | 03 |
| | 3.4 නවකතාව පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | • තුංමංහන්දිය නවකතාව මහගම සේකර | • චරිත නිරූපණ අවස්ථා හා සිද්ධි නිරූපණ අගය කරයි<br>• නව කතාව රසවිඳිමින් අගය කරයි | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0<br>ජනකවි හඳුනාගෙන රසාස්වාදය හා විචාරයේ යෙදෙයි. | 4.1 ජනකවි සාහිත්‍ය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි | • විවිධ වර්ගවලට අයත් ජනකවි විමර්ශනය කිරීම | • ජනකවි සාහිත්‍ය පිළිබඳ තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ වෘත්තීන් වලට අනුව ජනකවි වර්ග කර දක්වයි.<br>• ජනකවිවල විවිධත්වය අගය කරමින් කතා කරයි. | 03 |
| | 4.2 ජනකවි පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | • විවිධ වර්ගවලට අයත් ජනකවි | • ගැමි සිතුවිලි ජනකවිවලින් නිරූපණය වන අයුරු ඉදිරිපත් කරයි.<br>• ජනකවිවලින් විවිධ හැඟීම් ප්‍රකාශ කර ඇති අයුරු අගය කරයි.<br>• ජනකවි රසවිඳිමින් විචාරය කරයි. | 04 |
| 5.0<br>නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි. | 5.1නූතන පද්‍ය සාහිත්‍යයේ විවිධතා අධ්‍යයනය කරයි | • නූතන පද්‍ය සාහිත්‍යයේ විශේෂ ලක්‍ෂණ හා විවිධතා | • නූතන පද්‍ය නිර්මාණකරුවන්ගේ විශේෂතා ප්‍රකාශ කරයි.<br>• නූතන පද්‍ය සාහිත්‍යයේ විවිධ සම්ප්‍රදායයන් ප්‍රකාශ කරයි. | 05 |

## සාහිත්‍ය රසාස්වාදය විෂය නිර්දේශය - 10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 නූතන පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • යුතුකම - එස්. මහින්ද හිමි<br>• උතුරෙන් - සාගර පළන්සූරිය<br>• ආගන්තුක සත්කාරය - විමලරත්න කුමාරගම<br>• ඇත් ගාලේ දරු පෙම - චන්ද්‍රරත්න මානවසිංහ<br>• වැහි වලාකුළ - කුමාරතුංග මුනිදාස<br>• අලුත ගෙනා මනමාලිය ජී. බී. සේනානායක | • පද්‍ය නිර්මාණවල අරමුණ හඳුනා ගෙන පැහැදිලි කරයි<br>• පද්‍ය නිර්මාණයට පාදක වූ අත්දැකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි<br>• පද්‍ය නිර්මාණවලින් ධ්වනිතවන අදහස් ප්‍රකාශ කරයි<br>• කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | 24 |

## සාහිත්‍ය රසාස්වාදය විෂය නිර්දේශය - 11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි | 1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි | • නිර්දිෂ්ට නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම<br>- නිර්දිෂ්ට කෘතිවල නිර්මාණකරුවන්<br>- ලියවුණු කාලය<br>- එම කතුවරුන්ගේ වෙනත් නිර්මාණ<br>- සමකාලීන වෙනත් කතුවරු<br>- ඔවුන්ගේ නිර්මාණ | • නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිය අයත් සාහිත්‍ය අවධිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• කතුවරයා හා එම කෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• එම අවධියේ ලියවුණු වෙනත් නිර්මාණ හා සාහිත්‍යකරුවන් නම් කරයි | ඒ ඒ කෘති වලට වෙන්කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |
| | 1.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතුව කියවා පැහැදිලි කරයි. | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි. (නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව) | • නන්ද තෙරුන් වහන්සේගේ කතා වස්තුව කියවා අර්ථය පැහැදිලි කරයි.<br>• දුරවබෝධ පදවල අර්ථ දක්වයි. | |
| | 1.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | • නිර්දිෂ්ට නිර්මාණවල අවස්ථා සම්බන්ධය දැක්වීම (නන්ද මහ තෙරුන් වහන්සේගේ කතා වස්තුව) | • නිර්දිෂ්ට ග්‍රන්ථය හා කතුවරයා නම් කරයි.<br>• කෘතිය ලියවුණු අදාළ සාහිත්‍ය අවධිය නම් කරයි.<br>• උද්ධෘත පාඨවල අවස්ථා සම්බන්ධය නිවැරදි ව ඉදිරිපත් කරයි. | |

## සාහිත්‍ය රසාස්වාදය විෂය නිර්දේශය - 11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි | 2.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • (සද්ධර්ම රත්නාවලිය) නන්ද තෙරුන් වහන්සේගේ කතා වස්තුව | • නිර්දිෂ්ට කෘතියේ පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ විශේෂ ලක්‍ෂණ නන්ද තෙරුන් වහන්සේගේ වස්තුව ආශ්‍රයෙන් පැහැදිලි කරයි.<br>• කතා වස්තුවේ චරිත අවස්ථා හා සිද්ධි නිරූපණය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.<br>• නන්ද තෙරුන් වහන්සේගේ වස්තුව රස විඳිමින් විචාරය කරයි. | 15 |
| | 2.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • පුරාතන පද්‍ය විචාරය හා රසාස්වාදයට අදාළ ක්‍රියාකාරකම් | | 09 |

## සාහිත්‍ය රසාස්වාදය විෂය නිර්දේශය - 11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි. | 3.2 කෙටිකතා පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | • වැලපීම - ඇන්ටන් චෙකොෆ් කෙටි කතාව | • නිර්දිෂ්ට කෙටි කතාවේ පසුබිම විස්තර කරයි<br>• වැලපීම කෙටි කතාවේ කෙටි කතා ලක්‍ෂණ ඉස්මතුකර දක්වයි<br>• චරිත, අවස්ථා සිද්ධි නිරූපණ පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි | 06 |
| | 3.4 නවකතාව පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | • තුං මං හන්දිය නවකතාව රසාස්වාදයට හා විචාරයට අදාළ ක්‍රියාකාරකම් | • නිර්දිෂ්ට නවකතාවේ පසුබිම විස්තර කරයි.<br>• තුං මං හන්දිය නවකතාවේ නවකතා ලක්ෂණ ඉස්මතු කර දක්වයි.<br>• තුං මං හන්දිය නවකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.<br>• තුං මං හන්දිය නවකතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | 15 |
| 4.0 ජනකවි හඳුනාගෙන රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | 4.2 ජනකවි පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි | • නිර්දිෂ්ට ජනකවි රසාස්වාදයට හා විචාරයට අදාළ ක්‍රියාකාරකම් | • විවිධ ජනකවි හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• ගැමියන්ගේ සිතුවිලි ජනකවිවලින් නිරූපණය වන අයුරු ඉදිරිපත් කරයි.<br>• ජනකවි රසවිඳිමින් විචාරයේ යෙදෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රස විඳිමින් විචාරය කරයි | 5.3 නූතන පද්‍ය නිර්මාණ රසාස්වාදය හා විචාරයේ යෙදෙයි. | • උදය - සිරිගුනසිංහ<br>• වැස්ස - ගුණදාස අමරසේකර<br>• පුතු ඉපදුණු මේ දෙරණේ - මහගම සේකර<br>• දිසාපති කාමරයේ දී - මොනිකා රුවන්පතිරණ<br>• මග - රත්න ශ්‍රී විජේසිංහ<br>• කාන්තාර ගමක උපත - නන්දන වීරසිංහ | • පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනාගෙන පැහැදිලි කරයි.<br>• පද්‍ය නිර්මාණයට පාදක වූ අත්දැකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.<br>• කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | 30 |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 10 ශ්‍රේණිය
## සාහිත්‍ය පසුබිම

**නිපුණතාව :**

1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට සාහිත්‍ය කෘතියේ කතුවරයා ලියැවුණු කාලය හා එම නිර්මාණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- එම අවධියේ වෙනත් නිර්මාණකරුවන් නම් කරයි.
- ඔවුන්ගේ කෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- එම කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**කාලච්ඡේදඃ** මෙයට අදාළ කාලච්ඡේද නිර්දිෂ්ට කෘතිය සඳහා දී ඇති කාලච්ඡේදවලින් වෙන් කර ගන්න.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට කෘතිය හදාරන අවස්ථාවේ දී ඊට අදාළ සාහිත්‍ය පසුබිම සාකච්ඡා කරන්න.
- ඒ සඳහා පහත සඳහන් තොරතුරු උපයෝගී කරගන්න.

| අනු අංකය | සාහිත්‍ය නිර්මාණය | නිර්මාණකරුවා | ලියවුණු කාලය |
|---|---|---|---|
| 1 | කුස ජාතකය - පන්සිය පනස් ජාතක පොත | අඥාතයි | කුරුණෑගල අවධිය |
| 2 | සුභාෂිතය | අලගියවන්න මුකවෙටි | සීතාවක අවධිය |
| 3 | වෙසක් පහන | ජී. බී. සේනානායක | නූතන අවධිය |
| 4 | තුං මං හන්දිය | මහගමසේකර | නූතන අවධිය |
| 5 | ජනකවි | අඥාතයි | අඥාතයි |
| 6 | යුතුකම | එස්. මහින්ද හිමි | නූතන අවධිය |
| 7 | උතුරෙන් | සාගර පලන්සූරිය | නූතන අවධිය |
| 8 | ආගන්තුක සත්කාරය | විමලරත්න කුමාරගම | නූතන අවධිය |
| 9 | ඇත් ගාලේ දරු පෙම | චන්ද්‍රරත්න මානවසිංහ | නූතන අවධිය |
| 10 | වැහි වලාකුළ | කුමාරතුංග මුනිදාස | නූතන අවධිය |
| 11 | අලුත ගෙනා මනමාලිය | ජී. බී. සේනානායක | නූතන අවධිය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මේ සඳහා පහත නිර්ණායක යොදා ගන්න.

- නිර්දිෂ්ට කෘතිය අයත් යුගය පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- කතුරවයාගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.
- එම අවධියට අයත් නිර්මාණකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

**ගුරු භවතාගේ පරිශීලනය සඳහා**

- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ උපුටාගත් මුල් කෘතිය
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- සිංහල සාහිත්‍යයේ නැඟීම - මාර්ටින් වික්‍රමසිංහ
- සිංහල නවකතා ඉතිහාසය හා විචාරය - එදිරිවීර සරච්චන්ද්‍ර
- ජාතක කතා විමසුම - මාර්ටින් වික්‍රමසිංහ
- බණ කතා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ
- සිංහල සාහිත්‍ය - චාල්ස් ගොඩකුඹුරේ
- නව කවි සරණිය - විමල් දිසානායක
- නූතන සිංහල කාව්‍ය 1, 2 - ආරිය රාජකරුණා

## ජාතක කතා (කුස ජාතකය)

**නිපුණතාව:**

2.0 පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
1.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පැහැදිලි කරයි.
1.3 නිර්දිෂ්ට නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
2.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල:**

- කුසජාතක කතාවේ පසුබිම හඳුනාගෙන විස්තර කරයි.
- කුසජාතක කතාවේ කතා සාරය ඉදිරිපත් කරයි.
- කුසජාතක කතාවේ චරිත ලක්‍ෂණ විග්‍රහ කර දක්වයි.
- කුසජාතක කතාවේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- කුසජාතකයේ නිර්මාණාත්මක භාෂා ලක්‍ෂණ ඉදිරිපත් කරයි.
- කුසජාතක කතාව කියවා අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- කුසජාතක කතාව රසවිඳිමින් විචාරය කරයි.

**කාලච්ඡේද:** 11

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- කුසජාතක කතාවේ ඉතිහාසය හා පසුබිම පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. ඒ සඳහා 1.1 නිපුණතා මට්ටම යටතේ ඇති තොරතුරු උදව් කර ගන්න.
- නිර්දිෂ්ට කතාවෙන් කොටසක් ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවීමට සලස්වන්න.
- කුසජාතක කතාවේ දුරවබෝධ වචන කෙරෙහි අවධානය යොමු කරමින් අර්ථාවබෝධයට යොමු කරන්න.
- නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- නිර්දිෂ්ට කතාවේ
  - කතා ප්‍රවෘත්තිය
  - අවස්ථා හා සිද්ධි නිරූපණය
  - චරිත නිරූපණය
  - පසුබිම් නිරූපණය
  - නිර්මාණාත්මක භාෂා ලක්ෂණ

  යනාදි අංග කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනයට හා විචාරයට මග පෙන්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත නිර්ණායක යොදා ගන්න.

- කුස ජාතක කතාවේ පසුබිම පැහැදිලි කරයි.
- ජාතක කතාවෙන් කියවෙන ජීවිතාදර්ශ අගය කරයි.

- ජාතක කතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.
- කුස ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- කුස ජාතක කතාව කියවා අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- සිංහල සාහිත්‍යය 4 - ආනන්ද කුලසූරිය
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- ජාතක කතා විමසුම - මාර්ටින් වික්‍රමසිංහ

# සුභාෂිතය

**නිපුණතාව :**

2.0 පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

1.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පැහැදිලි කරයි.

2.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල :**

- සුභාෂිතයෙහි පසුබිම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට පද්‍යවල ගැබ් වූ උපදේශ හා උපමා අලංකාර හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට පද්‍ය රසවිඳිමින් විචාරයේ යෙදෙයි.
- නිර්දිෂ්ට පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියයි.

**කාලච්ඡේද** 11යි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- සුභාෂිතයෙහි කාලය, කතුවරයා, සමකාලීන වෙනත් කතුවරු ආදි පසුබිම් තොරතුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. ඒ සඳහා 1.1 නිපුණතා මට්ටම යටතේ (පිටුව 02) දක්වා ඇති තොරතුරු උදව් කර ගන්න.
- කවිවලින් දැක්වෙන උපදෙස් හා එම උපදෙස් ලබාදීම සඳහා භාෂාව නිර්මාණාත්මක ලෙස යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් අර්ථාවබෝධයට යොමු කරන්න.
- නියමිත පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිර්දිෂ්ට කවි රසවිඳිමින් විචාරය කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත නිර්ණායක යොදා ගන්න.

- නිර්දිෂ්ට කෘතියෙහි පසුබිම විස්තර කරයි.
- කාව්‍යාලංකාර මගින් රස උද්දීපනය වී ඇති අයුරු අගය කරයි.
- කවි පෙළෙහි අර්ථය ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට කවි පෙළ රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- සුභාෂිතය (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)
- ලෝකෝපකාරය (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)
- ලෝවැඩ සඟරාව
- සිරිත් මල්දම
- දැනමිති මාලය

# කෙටිකතා ලක්ෂණ

**නිපුණතාව :**

3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

3.1 කෙටිකතා ලක්‍ෂණ විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල :**

- කෙටිකතාව සාහිත්‍යාංගයක් ලෙස හඳුනාගෙන විස්තර කරයි.
- කෙටිකතාව පිළිබඳ වූ විවිධ නිර්වචන ඉදිරිපත් කරයි.
- කෙටිකතා ලක්ෂණ ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** 3යි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

- විවිධ නිර්වචන ඇසුරින් කෙටිකතාව නම් වූ සාහිත්‍යාංගය හඳුන්වා දෙන්න.
- පහත ඉදිරිපත් කර ඇති කෙටිකතා ලක්ෂණ ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
  - කතා ප්‍රවෘත්තිය
  - කතා වින්‍යාසය
  - චරිතාංග නිරූපණය
  - පසුබිම් නිරූපණය
  - යථාර්ථ නිරූපණය
  - සංකේත නිරූපණය
  - දෘෂ්ටිකෝණය
  - ජීවන දෘෂ්ටිය
  - නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
  - ඒකාබද්ධතාව
- කෙටිකතාව පිළිබඳ වූ විවිධ නිර්වචන එක් රැස් කිරීමට ශිෂ්‍යයින් යොමු කරන්න.

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මේ සඳහා පහත නිර්ණායක යොදා ගන්න.

- සාහිත්‍යාංගයක් ලෙස කෙටිකතාව නිර්වචන කරයි.
- කෙටිකතා ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- විවිධ නිර්මාණකරුවන් ඉදිරිපත් කළ නිර්වචන කෙටිකතා ලක්ෂණ ගොනුවක් සකස් කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- කෙටිකතා නිර්මාණය අධ්‍යයනය හා මූලධර්ම - රංජිත් ධර්මකීර්ති
- ජී. බී. සේනානායකගේ වෙනත් කෙටිකතා
- වහල්ලු (ප්‍රස්තාවනාව) - මාර්ටින් වික්‍රමසිංහ
- බවතිමිර (පෙරවදන) - ඒ. වී. සුරවීර

# වෙසක් පහන

**නිපුණතාව**

3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

1.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

3.2 කෙටිකතා පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම විස්තර කරයි.
- වෙසක් පහන කෙටිකතාවේ කෙටිකතා ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- වෙසක් පහන කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- වෙසක් පහන කෙටිකතාව පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 6යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- වෙසක් පහන කෙටිකතාවේ පසුබිම විස්තර කරන්න. ඒ සඳහා 1.1 නිපුණතා මට්ටමේ (පිටුව 2 ) දක්වා ඇති තොරතුරු උදව් කර ගන්න.
- වෙසක් පහන කෙටිකතාව කියවා අවස්ථා සම්බන්ධය දැක්වීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබාදෙන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවේ ගැබ් වූ කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් වෙසක් පහන කෙටිකතාව රසවිඳිමින් විචාරය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- වෙසක් පහන කෙටිකතාවේ තේමාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි අතර සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- කෙටිකතාවේ කලාත්මක ලක්ෂණ ඉදිරිපත් කරයි.
- කෙටිකතාව රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- ජී. බී. සේනානායකගේ වෙනත් කෙටිකතා

## නවකතා ලක්ෂණ

**නිපුණතාව :**

3.0 නූතන සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

3.3 නවකතා ලක්ෂණ විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල :**

- නවකතාව සාහිත්‍යාංගයක් ලෙස හඳුනාගෙන විස්තර කරයි.
- නවකතාවක තිබිය යුතු මූලික ලක්ෂණ හඳුනා ගෙන නම් කරයි.
- නවකතාව පිළිබඳ වූ විවිධ නිර්වචන එක් රැස් කරයි.

**කාලච්ඡේද** 3යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

නවකතාව නැමැති සාහිත්‍යාංගය පිළිබඳ නිර්වචන ඇසුරින් හඳුන්වා දෙන්න.
පහත සඳහන් නව කතා ලක්‍ෂණ ශිෂ්‍යයන්ට විස්තර කරන්න.

- කතා ප්‍රවෘත්තිය
- කතා වින්‍යාසය
- දෘෂ්ටි කෝණය
- චරිත නිරූපණය
- පසුබිම් නිරූපණය
- යථාර්ථ නිරූපණය
- සංකේත නිරූපණය
- නිර්මාණාත්මක භාෂා ලක්‍ෂණ
- ජීවන දෘෂ්ටිය

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- නවකතා නිර්මාණය හා අවබෝධය - ඒ. වී. සුරවීර
- සිංහල නවකතා ඉතිහාසය හා විචාරය - එදිරිවීර සරච්චන්ද්‍ර
- නිර්මාණය හා විචාරය - විමල් දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- සාහිත්‍යාංගයක් ලෙස නවකතාව හඳුනා ගෙන විස්තර කරයි.
- නවකතා ලක්ෂණ හඳුනාගෙන අගය කරයි.
- විවිධ විචාරකයන් විසින් ඉදිරිපත් කරන ලද නවකතාව පිළිබඳ නිර්වචන හා නවකතා ලක්ෂණ ගොනුවක් සකස් කරයි.
- කලාත්මක නවකතා හඳුනාගෙන කියවයි.

# තුං මං හන්දිය

**නිපුණතාව :**

3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

1.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

3.4 නවකතාව පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට නවකතාවේ පසුබිම විස්තර කරයි.
- තුං මං හන්දිය නවකතාවේ නවකතා ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- තුං මං හන්දිය නවකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- තුං මං හන්දිය නවකතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 20යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- තුං මං හන්දිය නවකතාවේ පසුබිම විස්තර කරන්න. ඒ සඳහා 1.1 නිපුණතා මට්ටමේ (පිටුව 2) දක්වා ඇති තොරතුරු උදව් කරගන්න.
- තුං මං හන්දිය නවකතාව කියවා අවස්ථා සම්බන්ධය ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබාදෙන්න.
- නිර්දිෂ්ට නවකතාවේ ගැබ් වූ නවකතා ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.
- තුං මං හන්දිය නවකතාව රසවිඳිමින් විචාරය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- තුං මං හන්දිය නවකතාවේ පසුබිම හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- නවකතාවේ කලාත්මක ලක්ෂණ අගය කරයි.
- නවකතාවේ අවස්ථා හා සිද්ධි අතර සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- නවකතාව රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- තුං මං හන්දිය නවකතාව - මහගමසේකර
- තුං මං හන්දිය (චිත්‍රපටය) - මහගමසේකර
- නවකතා නිර්මාණය හා අවබෝධය - ඒ. වී. සුරවීර

# ජනකවි සාහිත්‍යය

**නිපුණතාව :**

4.0 ජනකවි හඳුනා ගෙන රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :**

4.1 ජනකවි සාහිත්‍ය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ඉගෙනුම් පල :**

- ජනකවි සාහිත්‍ය පිළිබඳ තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විවිධ වෘත්තීන්වලට අනුව ජනකවි වර්ග කර දක්වයි.
- ජනකවිවල විවිධත්වය අගය කරමින් කතා කරයි.

**කාලච්ඡේද** 3යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පහත සඳහන් කරුණු ඇසුරින් ජනකවි සාහිත්‍යය ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
  - පොදු ජන ජීවිතය විෂය කොටගෙන පොදු ජනයා විසින් නිර්මාණය කිරීම.
  - පොදු ජන ජීවිතයට වඩාත් සමීප මාතෘකා ඔස්සේ නිර්මාණය වීම.
  - නිර්මාණයෙන් මතු වුණු අව්‍යාජ හැඟීම් නිරූපණය වීම.
  - විවිධ වෘත්තීන් අනුව වර්ග කළ හැකිවීම.
  - විවිධ අත්දැකීම් පදනම් කොටගෙන නිර්මාණය වීම.
  - සරල බස් වහර
  - සංයමය
  - විවිධ රස ජනනය
- ජනකවි සාහිත්‍යයේ විශේෂතා පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ජනකවි විවිධ වර්ග අනුව පෙළගැස්වීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- විවිධ ජනකවි එක් රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- ජනකවි සාහිත්‍ය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ජනකවිවලින් ප්‍රකට වන ගැමි සංස්කෘතික ලක්ෂණ අගය කරයි.
- ජනකවි විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.
- විවිධ ජනකවි එක්රැස් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ජනකවි 1 - ජාතික අධ්‍යාපන ආයතනය
- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- ජනකවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ - මිණිවන් පී තිලකරත්න
- සිවුපද හා සමාජය - නන්දදේව විජේසේකර

# ජනකවි

**නිපුණතාව :**

4.0 ජනකවි හඳුනා ගෙන රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :**

4.2 ජනකවි පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල :**

- ජනකවිවලින් විවිධ හැඟීම් ප්‍රකාශ කර ඇති අයුරු අගය කරයි.
- ගැමියන්ගේ සිතුවිලි ජනකවිවලින් නිරූපණය වන අයුරු ඉදිරිපත් කරයි.
- ජනකවි රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 4යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

- පෙළ පොතෙහි අන්තර්ගත ජනකවි වර්ග හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- එම ජනකවිවල ඇති විවිධත්වය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ජනකවි ගායනය කරමින් රසවිඳීමට අවස්ථාව ලබාදෙන්න.
- ඒ ඒ ජනකවිවල ගැබ් වූ අත්දැකීම් හඳුනා ගැනීමට සලස්වන්න.
- ජනකවිවලින් විවිධ ගැමි සංස්කෘතික ලක්ෂණ නිරූපණය වන ආකාරය පැහැදිලි කරන්න.
- විවිධ ජනකවි රසවිඳීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ජනකවිවල විවිධත්වය අගය කරයි.
- ජනකවියෙන් හෙළිවන ගැමි සිතුවිලි හා සංස්කෘතික ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ජනකවි රසවිඳිමින් විචාරය කරයි.
- විවිධ ජනකවි එක් රැස් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ජනකවි 1 - ජාතික අධ්‍යාපන ආයතනය

## නූතන පද්‍ය කාව්‍යයේ විවිධතා

**නිපුණතාව :**

5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

5.1 නූතන පද්‍ය සාහිත්‍යයේ විවිධතා අධ්‍යයනය කරයි.

**ඉගෙනුම් පල :**

- නූතන කාව්‍ය සාහිත්‍ය යුග හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නූතන කාව්‍ය සාහිත්‍යයේ විවිධ සම්ප්‍රදායන් ප්‍රකාශ කරයි.
- නූතන කාව්‍ය නිර්මාණකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ඔවුන්ගේ නිර්මාණවල සුවිශේෂතා ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** 6යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

- නූතන කාව්‍ය සාහිත්‍ය සම්ප්‍රදායන්, නිර්මාණකරුවන් හා නිර්මාණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- ඒ පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නූතන කාව්‍ය සාහිත්‍ය නිර්මාණවල සුවිශේෂතා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- නූතන කාව්‍ය සාහිත්‍යය අවධිය පිළිබඳ විස්තර කරයි.
- නූතන කාව්‍ය සාහිත්‍යයට අයත් නිර්මාණකරුවන් හා නිර්මාණ අගය කරයි.
- නූතන කාව්‍ය සාහිත්‍ය නිර්මාණ කියවා ඒවායේ විශේෂතා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- නවකවි විමසුම - මොනිකා රුවන්පතිරණ
- නවකවිසරණිය - විමල් දිසානායක
- නූතන සිංහල කාව්‍ය 1, 2 - ආරිය රාජකරුණා

# නූතන පද්‍ය

**නිපුණතාව :**

5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම් :**

5.2 නූතන පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල**

- පද්‍ය නිර්මාණවල අරමුණ හඳුනාගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 24යි (එක් පද්‍යයකට කාලච්ඡේද 04 බැගිනි)

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

- පහත කාව්‍ය නිර්මාණවල අරමුණ හා අත්දැකීම් පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  - යුතුකම (එස්. මහින්ද හිමි)
  - උතුරෙන් (සාගර පලන්සූරිය)
  - ඇත් ගාලේ දරු පෙම (චන්ද්‍රරත්න මානවසිංහ)
  - වැහිවලාකුළ (කුමාරතුංග මුනිදාස)
  - අලුත ගෙනා මනමාලිය (ජී. බී. සේනානායක)

- නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල

  වස්තු විෂය

  භාෂාව

  ධ්වනිතාර්ථ

  ආකෘතිය

  කාව්‍යෝපක්‍රම

  සම්ප්‍රදාය

  ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදීමට ශිෂ්‍යයන්ට මගපෙන්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- කාව්‍ය නිර්මාණවල අරමුණු හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- කවියෙහි ගැබ් වූ අත්දැකීම විස්තර කරයි.
- කාව්‍යෝපක්‍රම හඳුනාගෙන අගය කරයි.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදය කරමින් විචාරයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- නවකවි විමසුම - මොනිකා රුවන්පතිරණ
- නවකවි සරණිය - විමල් දිසානායක

## සාහිත්‍ය පසුබිම
## 11 ශ්‍රේණිය

**නිපුණතාව**

1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෘතිය අයත් සාහිත්‍ය අවධිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සාහිත්‍යය කෘතියේ කතුවරයා සහ එම නිර්මාණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- එම අවධියේ සිටි වෙනත් නිර්මාණකරුවන් නම් කරයි.
- ඔවුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**කාලච්ඡේද** මෙයට අදාළ කාලච්ඡේද නිර්දිෂ්ට කෘතිය සඳහා දී ඇති කාලච්ඡේදවලින් වෙන් කරගන්න.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:

- නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිය හදාරන අවස්ථාවේ දී ඊට අදාළ සාහිත්‍යය පසුබිම සාකච්ඡා කරන්න.
- ඒ සඳහා පහත සඳහන් තොරතුරු උදව් කරගන්න.

| අනු අංකය | සාහිත්‍ය නිර්මාණය | නිර්මාණකරුවා | ලියැවුණු කාලය |
|---|---|---|---|
| 1 | නන්ද මහතෙරුන් වහන්සේගේ වස්තුව - සද්ධර්ම රත්නාවලිය | ධර්මසේන හිමි | දඹදෙණි අවධිය |
| 2 | වැලපීම | ඇන්ටන් චෙකෝෆ් පරිවර්තනය -ඩබ්.ඒ.අබේසිංහ | නූතන අවධිය |
| 3 | උදය | සිරි ගුනසිංහ | නූතන අවධිය |
| 4 | වැස්ස | ගුණදාස අමරසේකර | නූතන අවධිය |
| 5 | පුතු ඉපදුණු මේ දෙරණේ | මහගම සේකර | නූතන අවධිය |
| 6 | දිසාපති කාමරයේ දී | මොනිකා රුවන්පතිරණ | නූතන අවධිය |
| 7 | මග | රත්න ශ්‍රී විජේසිංහ | නූතන අවධිය |
| 8 | කාන්තාර ගමක උපත | නන්දන වීරසිංහ | නූතන අවධිය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**
මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- නිර්දිෂ්ට කෘතිය අයත් කාලය පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- කතුවරයාගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.
- එම යුගයට අයත් නිර්මාණකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**
ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ උපුටා ගත් මුල් කෘතිය
- නූතන සිංහල කාව්‍ය I සහ II - ආරිය රාජකරුණා
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම - රංජිත් ධර්මකීර්ති
- සිංහල සාහිත්‍යය - චාල්ස් ගොඩකුඹුරේ
- සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය - ඒ. වී. සුරවීර
- නව කවි සරණිය - විමල් දිසානායක
- සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ
- බණ කතා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ

# සද්ධර්මරත්නාවලිය

**නිපුණතාව :**

2.0 පුරාතන ගද්‍ය හා පද්‍ය කාව්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
2.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.
1.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පැහැදිලි කරයි.
1.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෘතියේ පසුබිම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ විශේෂ ලක්ෂණ නන්ද මහ තේරුන් වහන්සේගේ වස්තුව ආශ්‍රයෙන් පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට කතා වස්තුවේ භාෂා උපක්‍රම හඳුනාගෙන අගය කරයි.
- දුරවබෝධ වචන පිළිබඳ අවබෝධයෙන් යුතුව කතාව ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- නන්ද මහ තෙරුන්ගේ කතා වස්තුව රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 15යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

- නිර්දිෂ්ට කෘතිය පිළිබඳ පසුබිම් විස්තරයක් ඉදිරිපත් කරන්න. ඒ සඳහා 1.1 නිපුණතා මට්ටමේ සඳහන් කරුණු (පිටුව 18) උදව් කරගන්න.
- දුරවබෝධ වචන කෙරෙහි අවධානයෙන් යුතු ව කතා වස්තුව පැහැදිලි කරන්න.
- නිර්දිෂ්ට කතා වස්තුවේ භාෂා භාවිතයේ විශේෂතා පිළිබඳ පැහැදිලි කරන්න.
- අවස්ථා සම්බන්ධය දැක්වීමට හා අර්ථය ලිහිල් බසින් ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිර්දිෂ්ට කතා වස්තුවෙහි අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය කෙරෙහි අවධානයෙන් යුතුව රසවින්දනයට හා විචාරයට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- නිර්දිෂ්ට කෘතියේ පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට කෘතියේ භාෂා භාවිතය අගය කරයි.
- නිර්දිෂ්ට කතා වස්තුවේ අවස්ථා සම්බන්ධය දක්වයි.
- නිර්දිෂ්ට කතා වස්තුව අර්ථාවබෝධයෙන් යුතුව කියවා ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කතාව රසවිඳිමින් විචාරය කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- සද්ධර්මරත්නාවලිය කෘතිය
- සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- බණ කතා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ

# වැලපීම

**නිපුණතාව**

3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම**

1.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවලට අදාළ සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
1.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
3.2 කෙටිකතා පිළිබඳ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට කොටිකතාවේ පසුබිම විස්තර කරයි.
- වැලපීම කෙටිකතාවේ කෙටිකතා ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 6යි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම් තොරතුරු ඉදිරිපත් කරන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවේ කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒ ඇසුරින් නිර්දිෂ්ට කෙටිකතාව රසවිඳිමින් විචාරයේ යෙදීමට ශිෂ්‍යයන්ට මගපෙන්වන්න.
- වැලපීම කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- වැලපීම කෙටිකතාවේ පසුබිම හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි අතර සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- කෙටිකතාව රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම් :**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- ඇන්ටන් චෙකොෆ්ගේ වෙනත් කෙටි කතා
- කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම - රංජිත් ධර්මකීර්ති
- කෙටිකතා විචාර මූලධර්ම හා සම්ප්‍රදාය - කුලතිලක කුමාරසිංහ

# නූතන පද්‍ය

**නිපුණතාව:**

5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම:**

5.2 පද්‍ය නිර්මාණ රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**ඉගෙනුම් පල:**

- පද්‍ය නිර්මාණවල අරමුණ හඳුනාගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** 30 (එක් පද්‍ය පන්තියකට 5 බැගිනි)

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පහත පද්‍ය නිර්මාණවල අරමුණ හා අත්දැකීම් පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  - උදය (සිරි ගුනසිංහ)
  - වැස්ස (ගුණදාස අමරසේකර)
  - පුතු ඉපදුණු මේ දෙරණේ (මහගමසේකර)
  - දිසාපති කාමරයේ දී (මොනිකා රුවන්පතිරණ)
  - මග (රත්න ශ්‍රී විජේසිංහ)
  - කාන්තාර ගමක උපත (නන්දන වීරසිංහ)
- නිර්දිෂ්ට කවිවල
  වස්තු විෂය, භාෂාව ධ්වනිථාර්ථ, ආකෘතිය, කාව්‍යෝපක්‍රම, සම්ප්‍රදාය ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

මේ සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- කාව්‍ය නිර්මාණවල අරමුණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කවිවල ගැබ් වූ අත්දැකීම් විස්තර කරයි.
- නිර්මාණකරුවා යොදා ගෙන ඇති කාව්‍යෝපක්‍රම පද්‍ය නිර්මාණ ඇසුරින් විස්තර කරයි.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදය කරමින් විචාරයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්**

ගුරුභවතාගේ පරිශීලනය සඳහා

- පෙළ පොත
- නවකවි සරණිය - විමල් දිසානායක
- නූතන සිංහල කාව්‍ය 1 සහ 2 - ආරිය රාජකරුණා